## පැප් පරීක්ෂණයේ ප්‍රතිඵල

**අසාමාන්‍ය නම්:**

- ගැබ්ගෙල පිළිකා ස්ථිරවම ඇත්දැයි හඳුනා ගැනීමේ පරීක්ෂණ සඳහා යොමු කෙරේ.
- ඒ සඳහා වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

**සාමාන්‍ය නම්:**

- එය සතුටු දායක පණිවිඩයකි.
- ඔබගේ ඊළඟ පැප් පරීක්ෂණය වසර 5කින් සිදුකර ගත යුතුය.

**පැප් පරීක්ෂණයට යොමු විය හැක්කේ කෙලසකද?**

- ඔබ ප්‍රදේශයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය මගින් පවත්වනු ලබන සුවනාරී සායනය මගින්.
- රෝහල් මගින් පවත්වන සුවනාරි/නාරිවේද සායන මගින්.
- පෞද්ගලික අංශයේ සායන මගින්.
- පිළිකා කලින් හඳුනා ගැනීමේ ජාතික සායනය මගින්.
  නො. 516, ඇල්විටිගල මාවත, නාරාහේන්පිට.
  අරකථන අංකය: 011 315 92 27





## නීරෝගී කාන්තාවනි,

- ඔබගේ ජීවිතය සතුටින් ගත කරන්න.
- පිරිසිඳු සෞඛ්‍ය ආරක්ෂණ පිළිවෙත් අනුගමනය කරන්න.

## නමුත් මේ ගැනත් සැළකිලිමත් වන්න

ඔබගේ ලිංගික ජීවිතය විශ්වාසවන්ත එක් සහකරුවෙකුට සීමා කරන්න.

එසේ නොවන ලිංගික ඇසුරකදී උපත් පාලන කොපු භාවිතා කරන්න. ආරක්ෂික ලිංගික ක්‍රියා පිළිපදින්න.

**නීරෝගී සුවබර දිවියකට**
**පැප් පරීක්ෂණය**
**ඔබ වෙනුවෙන්මයි**

**එය,**
**සුවනාරි සායන මගින්**
**නොමිලේ**
**ඔබ වෙත සැපයෙන**
**ප්‍රජා සේවාවකි.**


**ජාතික පිළිකා මර්දන වැඩ සටහන**
555, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට, කොළඹ 05
ටෙලි : 011-2368627, 0113159227

E : nccpsl@yahoo.com
W : www.health.gov.lk


Produced by : PRINTCARE

# ගැබ්ගෙල පිළිකාව වළක්වා ගෙන ජීවිතය ජය ගමු



**නිරෝගී කාන්තාවක් වන්න**
**ජීවිතය සතුටින් ගත කරන්න**

## ඔබ දන්නවාද?

ශ්‍රී ලංකාවේ කාන්තාවන්ට සෑදෙන පිළිකා අතරින් ගැබ්ගෙල පිළිකාව දෙවන ස්ථානය ගන්නා බව !

ගැබ්ගෙල පිළිකාවක් පූර්ව පිළිකා අවධියේදී පැප් පරීක්ෂාව මගින් හඳුනා ගත හොත් එය සම්පූර්ණයෙන්ම සුව කළ හැකි බව !

**ඔබගේ පැප් පරීක්ෂාව කර ගැනීමට**
**රෝග ලක්ෂණ පහල වන තුරු නොසිටින්න**




## ගැබ්ගෙල පිළිකාවක මූලික රෝග ලක්ෂණ මොනවාද?

- යෝනි මාර්ගයෙන් අක්‍රමවත් රුධිර වහනය.
- ලිංගික සංසර්ගයට පසු රුධිර වහනය.
- යෝනි මාර්ගයෙන් අධික දුර්ගන්ධයකින් යුත් ශ්‍රාවයක් පිටවීම.
- මාස් ශුද්ධිය නැවතී ඇති කාන්තාවන්ගේ යෝනි මාර්ගයෙන් රුධිරය පිට වීම.

## ගැබ්ගෙල පිළිකාවක අවදානම වැඩි කාටද?

- HPV (හියුමන් පැපිලෝමා) නමැති වෛරසය ආසාදිත කාන්තාවන් ට.
  - ගැබ්ගෙල පිළිකා 95%කට වඩා HPV ආසාදනය මගින් සිදුවේ.
  - ලිංගික ජීවිතය ඇරඹීමට පෙර HPV එන්නත ලබා ගැනීමෙන් මෙම ආසාදනයට ලක්වීම වලක්වා ගෙන එමගින් ගැබ්ගෙල පිළිකාව වලක්වා ගත හැක.
  - දැනට මෙම එන්නත ශ්‍රී ලංකාවේදී ලබා ගත හැක්කේ පෞද්ගලික වෛද්‍ය සේවා මගින් පමණි.
- අඩු වයසින් ලිංගික ජීවිතය ඇරඹූ කාන්තාවන් ට.
- බහු පුරුෂ සේවනයේ යෙදෙන කාන්තාවන් ට.
- බහු ස්ත්‍රී සේවනයේ යෙදෙන පුරුෂයන් සමග ලිංගිකව සම්බන්ධ වන කාන්තාවන් ට.
- අක්‍රීයව හෝ සක්‍රීයව දුම් පානයේ යෙදෙන කාන්තාවන් ට.
- විවිධ රෝග සඳහා ප්‍රතිශක්තීකරණය හීන කරවන බෙහෙත් ගන්නා කාන්තාවන් ට.
- ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සෑදී ඇති කාන්තාවන් ට.

## ගැබ්ගෙල පිළිකාව පූර්ව පිළිකා අවධියේදී හඳුනා ගත හැකිද? ඔව්

"අනෙකුත් පිළිකා වර්ග මෙන් නොව ගැබ්ගෙල පිළිකාව වලක්වා ගත හැක. ගැබ්ගෙලෙහි සිදුවන වෙනස්කම් මුල් අවස්ථාවේදී හඳුනාගැනීමෙන් හා ප්‍රතිකාර කිරීමෙන් එම මූලික අවස්ථාවන් පිළිකාවක් බවට කල් යාමේ දී පත් වීමට ඇති හැකියාව වලකාලයි."

## ඔබ ගැබ්ගෙල පිළිකාවක් සෑදීමේ අවදානමක සිටින බව කලින් දැන ගත හැකිද?

### එය කළ හැකියි

### පැප් පරීක්ෂාවකින්

- පැප් පරීක්ෂාවක් යනු; ගැබ්ගෙල ආශ්‍රයෙන් සිදු කරන සරල පරීක්ෂණයකි.
- මේ සඳහා ඔබ පැමිණිය යුතු වන්නේ මාසික ශුද්ධ වීම සිදු වී නොමැති දිනකදී ය.
- මෙමගින් ඔබට කිසිඳු වේදනාවක් හෝ අපහසුතාවයක් ඇති නොවේ.
- මෙමගින් ගැබ්ගෙලෙහි පූර්ව පිළිකා සෛල හඳුනා ගත හැක.

## පැප් පරීක්ෂණයට යොමු විය යුත්තේ කවුද?

- පැප් පරීක්ෂණය නිරෝගී කාන්තාවන් වෙනුවෙනි.
- ලිංගික සම්බන්ධතා පවත්වන සියලු කාන්තාවන් සඳහා ප්‍රථම ලිංගික එක්වීමෙන් වසර 5කට පසු මෙය නිර්දේශ කෙරේ.
- මෙම පරීක්ෂණය අවුරුදු 35ට වැඩි කාන්තාවන්ට සුවනාරි සායන වලදී කර ගත හැක.

